# පළාත් සභා නිවේදන

අංකය : වා/පස/2/1/19/26(1).

## වයඹ පළාත් සභාව

### වයඹ පළාතේ, පළාත් සභාවේ 2004 අංක 4 දරන පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීමේ ) (සංශෝධන ) ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ, පළාත් සභාව විසින් 2005.02.01 වැනි දින සම්මත කරන ලදුව 2005.02.16 වැනි දින වයඹ පළාතේ ආණ්ඩුකාරවරයා අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියළු දෙනාගේම දැන ගැනීම සඳහා මෙහි පළ කරමි.

එස්. එම්. ජයතිලක,
ලේකම්,
වයඹ පළාත් සභාව.

2005 පෙබරවාරි මස 14 වැනි දින,
කුරුණෑගල, වයඹ පළාත් සභාවේ සභා කාර්යාලයේ දී ය.

### වයඹ පළාතේ, පළාත් සභාවේ 2004 අංක 4 දරන පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීමේ) (සංශෝධන) ප්‍රඥප්තිය

වයඹ පළාතේ, පළාත් සභාවේ 1989 අංක 3 දරන පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීමේ) ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ, පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

| | | |
|---|---|---|
| ලුහුඩු නාමය. | 1. | මෙම ප්‍රඥප්තිය වයඹ පළාතේ පළාත් සභාවේ 2004 අංක 4 දරන පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීමේ ) (සංශෝධන ) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ. |
| ප්‍රධාන ප්‍රඥප්තියේ 2(ඇ)උප වගන්තිය සංශෝධනය කිරීම. | 2. | ප්‍රධාන ප්‍රඥප්තියේ 2 (ඇ) උප වගන්තියේ සඳහන් "රුපියල් එක්දාහක" යන පාඨය ඉවත් කොට, ඒ වෙනුවට " රුපියල් එක්දහස් පන්සියයක" යන පාඨය ඇතුළත් කිරීමෙන් සංශෝධනය කරනු ලැබේ. |
| අනනුකූලතාවක් වුවහොත් සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව. | 3. | මෙම ප්‍රඥප්තියේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය. |

03-526